# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1791/10 - 2012 දෙසැම්බර් මස 31 වැනි සඳුදා - 2012.12.31**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

**බස්නාහිර පළාතේ පළාත් සභාව**

නිවේදනය

බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වශයෙන් 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු මහ නගර සභා ආඥාපනතේ 289 වැනි වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව සාදා ඇති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1769/4 හා 2012 ජූලි 30 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද මහ නගර සභා නගරාධිපති, උප නගරාධිපති හා සභිකවරුන්ට සඳහා වන ස්ථාවර කමිටු සහභාගිත්ව දීමනාවලට අදාළ නියෝග, බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් 2012.11.06 වැනි දින රැස්වීමේ දී අනුමත කරන්නට යෙදුන බව 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු මහ නගර සභා ආඥාපනතේ 289 වැනි වගන්තියේම වැඩිදුරටත් සඳහන් විධිවිධාන යටතේ මෙයින් නිවේදනය කරමි.

ප්‍රසන්න රණතුංග,
බස්නාහිර පළාතේ පළාත් සභාවේ, ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා ක්‍රම සම්පාදන,
නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන,
විදුලිබල හා බලශක්ති, මිනිස් බල හා රැකීරක්ෂා සහ
ආර්ථික ප්‍රවර්ධන අමාත්‍ය,
බස්නාහිර පළාත.

2012 නොවැම්බර් මස 30 වැනි දින,
කොළඹ 07,
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ,
ශ්‍රාවස්ති මන්දිරයේ දී ය.

01 - 437/1

1A - PG 001491 — 395 (2012/12)

**බස්නාහිර පළාතේ පළාත් සභාව**

නිවේදනය

බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වශයෙන් 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 255 අධිකාරය වන නගර සභා ආඥාපනතේ 193(1)(උඋ) උපවගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව සාදා ඇති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1769/4 හා 2012 ජූලි 30 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නගර සභා සභාපති, උප සභාපති හා සභිකවරුන්ට සඳහා වන කාරක සභා සහභාගිත්ව දීමනාවලට අදාළ රීති, බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් 2012.11.06 වැනි දින රැස්වීමේ දී අනුමත කරන්නට යෙදුන බව 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 255 අධිකාරය වන නගර සභා ආඥාපනතේ 194 වගන්තියේ විධිවිධාන යටතේ මෙයින් නිවේදනය කරමි.

ප්‍රසන්න රණතුංග,
බස්නාහිර පළාතේ පළාත් සභාවේ, ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා ක්‍රම සම්පාදන,
නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන,
විදුලිබල හා බලශක්ති, මිනිස් බල හා රැකීරක්ෂා සහ
ආර්ථික ප්‍රවර්ධන අමාත්‍ය,
බස්නාහිර පළාත.

2012 නොවැම්බර් මස 30 වැනි දින,
කොළඹ 07,
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ,
ශ්‍රාවස්ති මන්දිරයේ දී ය.

01 - 437/2

---

**බස්නාහිර පළාතේ පළාත් සභාව**

නිවේදනය

බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වශයෙන් 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 184 වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව සාදා ඇති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1769/4 හා 2012 ජූලි 30 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ප්‍රාදේශීය සභා සභාපති, උපසභාපති හා සභිකවරුන්ට සඳහා වන කාරක සභා සහභාගිත්ව දීමනාවලට අදාළ රීති, බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් 2012.11.06 වැනි දින රැස්වීමේ දී අනුමත කරන්නට යෙදුන බව 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 184(2) උපවගන්තියේ විධිවිධාන යටතේ මෙයින් නිවේදනය කරමි.

ප්‍රසන්න රණතුංග,
බස්නාහිර පළාතේ පළාත් සභාවේ, ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා ක්‍රම සම්පාදන,
නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන,
විදුලිබල හා බලශක්ති, මිනිස් බල හා රැකීරක්ෂා සහ
ආර්ථික ප්‍රවර්ධන අමාත්‍ය,
බස්නාහිර පළාත.

2012 නොවැම්බර් මස 30 වැනි දින,
කොළඹ 07,
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ,
ශ්‍රාවස්ති මන්දිරයේ දී ය.

01 - 437/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.